# කඩිසර කූඹියෝ



B.A.THISENI ONADEE BANDARA

# කඩිසර කූඹියෝ

B.A.THISENI ONADEE BANDARA

# කඩිසර කුඹියෝ

බී.ඒ.තිසෙනි ඔනාදි බණ්ඩාර

5 ශ්‍රේණිය D

මහාමායා බාලිකා විදුහල

මහනුවර

මුද්‍රණය

2025.02.08

කතෘ ගේ වෙනත් කෘති

- ගස් මුදුනේ සිට ගී ගයන කොහාගේ සත්‍ය කතාව
- නරක මිතුරු ඇසුර
- කවි සහ තේරවිලි

ISBN– 978 – 624 – 208 - 177 - 9

# <u>පිදුම</u>

මිණිකැට මෙන් මුතු අකුරු එකිනෙක

පද බැද

සිප් සතර මුල පුරන්නට දිරිය දුන්

මාගේ භද්‍රා ගුරු මෑණියන්ටද

නිතැතින් මාගේ සෙවනැල්ල මෙන්

හිදිමින් සියලු කාර්යන්ට ශක්තියක්

වන

මාගේ මවට , පියාට

පුදමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙනේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතිය ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සදහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

එකමත් එක දවසක දිරාගිය පොල් ගසක් මුල විශාල කූඹි ගුලක් තිබුණා. මෙහි වාසය කළ කූඹියෝ හරිම කඩිසරයි. ඒ වගේම හරිම සමගියි.

ඉතින් ඔහොම ටික කාලයක් ඉන්නකොට කූඹි ගුලේ සාමජිකයන් වැඩි වුණා. කූඹි ගුලේ ඉඩ කඩ අඩුවුණා.



මේ නිසා තරුණ කූඹියන් අතර අසමගියක් ඇති වුණා. අසමගිකම නිසා කූඹියන්ගේ තිබුණු කඩිසරකම නැති වුණා. ඉතින් වයසක කූඹියෝ සිටියෙ හරිම දුකෙන්.

මේ ගැන වැඩිපුරම දුක් වූ කූඹි ගුලේ වයසකම කූඹි ආතා අසනීප වුණා. කොච්චර වෙදකම් කළත් ලෙඩේ සුව වුණේ නැහැ.





මේකට හේතුව තරුණ කූඹියන්ගේ අසමගිකම බව ගුලේ සියලු දෙනාම කතා වුණා. හැමෝම දුක් වුණා.

"දැන් ඔන්න වැහි කාලයත් ළං වේගෙනයි එන්නේ" කූඹි තාත්තා කිව්වා.

"මෙහෙම හිටියොත් අපේ පුංචි පැටවුන්ට බඩගින්නේ තමයි ඉන්න වෙන්නේ" කූඹි අම්මත් කිව්වා.

"අපි හැමෝම එකතු වෙලා කූඹි ගුල ලොකු කරමු" කූඹි ආතා යෝජනා කලා. අසනීප වී සිටියත් කූඹි ආතාට ඕන වුණෝ ගුලේ සමගිය රැකගෙන තමන්ගේ පරම්පරාව හොඳ ගතිගුණ තියෙන කූඹින් ලෙස සමගියෙන් සිටින අයුරු දැකීමයි.



"මේ පොල් ගස මුල කොච්චර ඉඩ තියෙනවද, පුළුවන්, ඒ වගේම හැමෝම එකතු වී වැඩ කලොත් කූඹි ගුල විශාල කර ගන්නට වැසි කාලයට කලින් කෑමත් රැස් කරමු." ලෙසට වැඩිහිටි කූඹියෝ කතා වුණා.



කූඹි ගුලේ ආච්චිලා, සීයලා, අම්මලා, තාත්තලා එකතු වෙලා කූඹි ගුල ලොකු කරන්ට පටන් ගත්තා.

අවශ්‍ය දේවල් රැස් කරමින් දිවා රාත්‍රී නොබලා මහන්සි වී වැඩ කළා. තරුණ කුඹියන්ට ආදර්ශයක් වීමට ඔවුන්ට උවමනා වුණා.

අසමගියෙන් සිටි තරුණ කූඹියෝ මේ නිසා ලැජ්ජාවට පත් වුණා.



ඉතින් එයාලත් ටිකෙන් ටික මේ වැඩේට උදව් වුණා. කූඹි ගුල හිතුවාටත් වඩා විශාල වුණා. හැමෝටම වෙනම කාමර ද වෙන් කර ගත්තා.



දැන් කූඹියන්ට හරිම සතුටුයි. අසමගියෙන් සිටිය කූඹියෝ ආයෙමත් කඩිසරකමින් වැඩ කරන්න පටන් ගත්තා. කෑම හොයාගෙන උදෙන්ම ගුලෙන් එළියට යන කූඹියෝ එම කාර්ය ඉතා හොඳින් කලා.



කූඹි ගුලේ සිටිය වයසකම කූඹියත් ටික ටික සුවය ලැබුවා. කුහුඹුවන් එකමුතු වී වැඩ කරන අයුරු දුටු කූඹි ආතා වැඩ කල යුතු පිළිවෙල ගැන නිරන්තරයෙන් උපදෙස් ලබා දුන්නා.



ඉතින් එයාලට තේරුණා සමගිය මොතරම් බලවත්ද කියලා. නැවත කවදාවත් එයාලා අසමගි වුණේ නැහැ.

වැස්ස කාලෙට කලින්ම කෑම රැස්කර ගැනීමටත් සියලුදෙනා එකමුතු වී වැඩ කිරීමටත් හැමෝම සිතට ගත්තා.



# පසුවදන

රටේ අනාගත සංවර්ධනය ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශිය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායීතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ ධරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමඟ ඔක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්